**10-01-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබේ ස්මෘති වන්දනාව බොහෝ අප්‍රකටය. ඔබ දරුවන් දැන් විමුක්ති දේශය කරා යමින් සිටී.

**ප්‍රශ්නය:** ශාරීරික ලෝකයේ නිවැසියෙක් බවින්, සූක්ෂම ලෝකයේ නිවැසියෙක් බවට පත් වීමට ඔබ කළ යුතු උත්සාහය කුමක්ද?

**පිළිතුර:** සූක්ෂම කලාපයේ සුරදූතයෙක් බවට පත්වීමට, සහමුලින් ආධ්‍යාත්මික සේවයට කැප වන්න. සුරදූතයින්ට මස් හෝ ඇට නැති නිසා, ඔබට සුරදූතයෙක් විය නොහැකියි; ඇටමිදුළු කැප නොකර. දාදීජී සෘෂි කළාක් මෙන් ඔබ මෙම අසීමිත සේවය සියලු ඇට මිදුළු යොදා කළ යුතුව ඇත. එවිට පමණි ඔබ ශාරීරික බවින් සූක්ෂම බවට පත්වන්නේ.

**ගීතය:** ඉවසන්න, හිත ඉවසන්න! ඔබේ සතුටු කාලය ඒමට ආසන්නයි!

ඕම් ශාන්ති. ඔබ දරුවන් මෙම ගීතයෙන් ඉවසීම ලැබීමට සංඥාවක් ලැබුවා. ඔබ දරුවන් දන්නවා ශ්‍රීමත් පදනම මත ඔබ උත්සාහ දරමින් සිටිනා බව. ඔබ අප්‍රකට ස්මෘති වන්දනාවේ සිටින බවත් ඔබ දන්නවා. අනෙකුත් වන්දනා ගමන් ඒ ඒ කාල වලදී අවසන් වේ. මෙම වන්දනා ගමන ගැන අනෙකුත් අය නොදන්නා ඔබ දන්නා ප්‍රධාන දේ නම්, ඔබ එය දන්නා බවයි. ඔබ මේ වන්දනා ගමන නියතයෙන්ම යා යුතු වන අතර මඟ පෙන්වන්නාද අවශ්‍ය වෙයි. ඔබ නම් කර ඇත්තේ පාණ්ඩව බලඇණිය ලෙසයි. ඔබ සිටින්නේ වන්දනා ගමනකය. එය භෞතික යුද්ධයක් පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. මෙහි දී සියල්ල අප්‍රකටය. මෙම වන්දනා ගමන ද ඉතා අප්‍රකටය. ආගමික ලේඛණ වල එය කියන්නේ මෙසේය පියා කතා කරයි මා සිහිකළ විට ඔබට මා හමු වෙයි! මෙයද වන්දනා ගමනක් නේද? පියා ඔබට සියලු ආගමික ලේඛණ වල සාරය කියා දෙයි. ඔහු මේ සියල්ල ප්‍රායෝගික ලෙස ක්‍රියාවට නංවයි. ජීවාත්ම සත්තාවන් වන අප නිර්වාණ දේශය කරා අපේ වන්දනා ගමන යා යුතුව ඇත. ඔබ ඒ ගැන සිතතොත් තේරුම් ගත හැකිය. විමුක්ති දේශයට යන සැබෑ වන්දනා ගමන මෙයයි. සැම කෙනෙකුටම අවශ්‍ය විමුක්ති දේශයට යාමටයි. ඔවුනට මෙම වන්දනා ගමන යාම සඳහා කවුරු හෝ විමුක්ති දේශයට මඟ කිවයුතු වුවත්, පරම පියා ඔහු විසින්ම ඔහුගේ වේලාවට පැමිණෙයි. කිසිවෙක් එම වේලාව දන්නේ නැත. පියා පැමිණ විස්තර කළ විට ඔබ දරුවන්ට ශ්‍රද්ධාවන්ත විශ්වාසය ඇති වෙනවා ඔබ සිහි කරමින් සිටි සැබෑ වන්දනා ගමන මෙය මැයි කියා. පියා අපට මෙම වන්දනා ගමන ඉගැන්වුවා. මන්මනභාව්! මධ්‍යාජීභාව්! ඔබට මෙම පද ඉතා ප්‍රයෝජනවත්. කළ ලොකුම වරද වන්නේ කවුද එය කීවේ යන්නයි. ඔහු මෙසේ කියයි ඔබේ ශරීරයත් ශරීරය හා බැඳුනු සියල්ලත් අමතක කරන්න. මොහු (බ්‍රහ්ම බාබා) වද ශරීරයක් ඇත. තමාටම කියා ශරීරයක් නැත්තේ වෙන කෙනෙකුට වන අතර ඔහු මොහුට විස්තර කර දෙයි. එම පියාට ප්‍රතිබිම්බයක් නොමැත (මෙය විචිත්‍රයි). ඔහුටම කියා ප්‍රතිබිම්බයක් නැත. අන් සැමට ප්‍රතිබිම්බයක්(චිත්‍ර) ඇත. මුළු ලොවම ගැලරියකි (ප්‍රතිබිම්බ සහිත අයගේ ස්ථාන). මෙම මනුෂ්‍ය ස්වරූපය සාදා ඇත්තේ ප්‍රතිබිම්බයක් නැතිව සහ ප්‍රතිබිම්බ සහිත දේ එකතුවයි. එනම්, අජීව ශරීරය සහ ජීවාත්ම සත්තාවයි. එම පරමාත්ම පියා ප්‍රතිබිම්බයක් නැති කෙනෙකි. ඔහු විස්තර කරන්නේ ඔහුට මෙම ප්‍රතිබිම්බයේ(ශරීරයේ) සහයක් ලැබිය යුතු බවයි. ආගමික ලේඛණ ලියා ඇත්තේ මහා භාරත යුද්ධය කෙරෙන විට දෙවියන් කියූ බවයි. ඔහු රාජයෝගා උගන්වා රජදහන නියත ලෙස ස්ථාපනය කළේය. දැන් රජ දහනක් නැත. විනාශය අතලඟ නිසා ඔහු රාජයෝගා ඉගැන්වූයේ නව ලෝකයටයි. දෙව්ලොව ස්ථාපනය වීමේ දී එය එසේ සිදු වූවා යැයි විස්තර කර ඇත. එම ලක්ෂ්මී නාරායන රජ දහන ස්ථාපනය විය. දැන් ඔබේ බුද්ධිය දන්නවා එකල සත් යුගය තිබූ අතර දැන් එය කලි යුගය බව. එම දෙයම පරම පියා දැන් විස්තර කරයි. වෙන කිසිවෙක් ඔහු උත්තරීතර දනව්වේ සිට ඔබ රැගෙන යාමට ආවා යැයි කිව නොහැකියි. බ්‍රහ්මා මඟින් මෙය කිව හැක්කේ පරමපිතා, පරමාත්මයට ම පමණි. වෙන කෙනෙක් තුළින් ඔහුට මෙය කිව නොහැක. සූක්ෂම කලාපයේ බ්‍රහ්මා, විෂ්ණු සහ ශංකර් සිටී. ඒ සූක්ෂම බ්‍රහ්මා බවත් මෙහි සිටින්නේ ශාරීරික බ්‍රහ්මා බවත් විස්තර කර ඇත. ඔබ දැන් සුර දූතයින් බවට පත් වෙමින් සිටී. ශාරීරික ලෝකයේ සුර දූතයින් නොසිටිනු ඇත. සුර දූතයින්ට ඇට, මස්, ශරීර නැත. මෙහිදී, ඔබ ඇට මිදුළු කැප කර මෙම ආධ්‍යාත්මික සේවය කිරීම මඟින් සුරදූතයින් බවට පත් විය හැක. මේ මොහොතේ ඔබට අස්ථි තිබේ. කෙනෙක් ඇටමිදුළු යොදා සේවය කළා යැයි ලියවී ඇත්තේ ඔහු ඇට මිදුළු අහවර කළා යන අදහසිනි. ශාරීරික ලෝකයේ නිවැසියන්ව සිට ඔබ සූක්ෂම කලාපයේ නිවැසියන් බවට පත් වී තිබේ. අප

මෙහිදී සියලු අස්ථි කැප කර සූක්ෂම බවට පත් වී ඇත. ඔබ සේවය සඳහා සියල්ල කැප කළ යුතුව ඇත. ස්මෘතියේ සිටිය දී, අප සුරදූතයින් බවට පත් වේ. ගොදුරට මරණය වන අතර, දඩයක්කාරයාට ප්‍රීතිය වෙයි යන්න සිහිපත් කෙරේ. සුරදූතයින් දඩයක්කාරයන් යැයි කියැවේ. ඔබ මනුෂ්‍යා බවින් සුරදූතයින් බවට වෙනස් වෙයි. ඔබට දෙවි දේවතාවුන් යැයි කිව නොහැක. මෙහිදී ඔබට ශරීර ඇත. සූක්ෂම ලෝකය පිළිබඳ විස්තර ලැබෙන්නේ මෙකලය. ඔබ යෝගාවේ සිට සුරදූතයින් බවට පත්වේ. අවසානයේ දී ඔබ සුර දූතයින් වෙයි. ඔබට සියල්ල පිළිබඳ දර්ශන ලැබෙන අතර සතුටද ඇත. සියලු මනුෂ්‍යායින් මරණයේ ගොදුරු බවට පත් වේ. ඔබ අතරේ සිටින මහා වීරයින් නොසැලී සිටී. තව බොහෝ දේද දිගටම සිදුවේ. විනාශයේ දසුන් සිදුවිය යුතුව ඇත. අර්ජුනට විනාශය දිස්විය. එය අර්ජුන පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. ඔබ දරුවන්ට විනාශය හා ස්ථාපනය පිළිබඳ දර්ශන ලැබේ. සියල්ලට පළමු, බාබාට විනාශය පිළිබඳ දර්ශනය ලැබුණි. එකල ඔහුට කිසිදු දර්ශනයක් නොලැබුණි. ඔහු ලෝකය විනාශ වන හැටි දුටුවේය. ඉන්පසු ඔහුට අත් හතරේ ප්‍රතිබිම්බය (විශ්ණු) දර්ශනය විය. ඔහු තේරුම් ගන්නට පටන් ගත්තා එය ඉතා හොඳ බවත් ඒ නිසාම විනාශයෙන් පසු අප ලෝකයේ හිමිකරුවන් වන බවත්. ඒ නිසා ඔහු සතුටු විය. විනාශය හොඳ බව ලෝකය නොදනී. ඔවුන් කොතෙක් සාම සැළසුම් හැදුවත් අවසානයේ දී විනාශය සිදු විය යුතුව ඇත. ඔවුන් පාරිශුද්ධකරුවා සිහි කර ඔහුට පැමිණෙන්න කියයි. එමනිසා, පරම පියා නියතයෙන්ම පැමිණෙයි. ඔහු පැමිණ අප විසින් පාලනය කරනු ලබන පිරිසිදු ලෝකය ස්ථාපනය කරනු ලබයි. එය හොඳයි නේද? ඔවුන් පිරිසිදුකරුවාණන් සිහි කරන්නේ ඇයි? ඒ ඔවුන් අසතුටින් සිටින නිසාය. දෙවි දේවතාවන් ඇත්තේ පිරිසිදු ලෝකයේය. ඔවුන්ට අපිරිසිදු ලෝකයේ පය තැබිය නොහැක. එමනිසා, අපිරිසිදු ලෝකය නියතයෙන්ම විනාශ විය යුතුව ඇත. විශාල විනාශයක් වූ බව ද සිහිපත් කර ඇත. ඊට පසු සිදු වූයේ කුමක් ද? එකම ආගම ස්ථාපනය වූයේ එසේ නේද? දැන් ඔබ මෙහි රාජයෝගා ඉගෙනගත් විට විනාශය සිදුවෙයි. එවිට භාරතයේ ඉතිරිවන්නේ කවුද? රාජයෝගා හදාරා එම ඥානය දෙන අය ඉතිරි වේ. අන් සැම විනාශ විය යුතුයි. මේ ගැන බිය විය යුතු නැත. මිනිසුන් පාරිශුද්ධකරුවාණන්ට එන්නට යැයි අඬගසයි. එමනිසා, ඔහු ආ විට ඔවුන් සතුටු වෙයි. පරම පියා මෙසේ කියයි පාපයේ නොගැලෙන්න. මෙම පාප ජය ගන්න. මේවා අතහැර දැමූ විට අපල දුරු වනු ඇත. භාරතය මත ඇති අපලය නියතයෙන්ම දුරු කළ යුතුය. ඔබ විරූපී බවින් සුරූපී බවට පත් විය යුතුය. සත් යුගයේ සිටියේ පිරිසිදු දෙවි දේවතාවුන්ය. ඔවුන් එසේ පත් වූයේ මෙහිමය. ඔබ දන්නවා අප පාපයෙන් තොර වන්නේ ශ්‍රීමත් අනුගමනයෙන් බව. පරමාත්ම දෙවියන් කතා කරයි මෙය අප්‍රකටය. ශ්‍රීමත් අනුගමනය කිරීම මඟින් ඔබට ස්වාධිපත්‍යය ලැබේ. පියා මෙසේ කියයි ඔබ සාමාන්‍ය මනුෂ්‍යා බවින් නාරායන බවට වෙනස් විය යුතුයි. එවිට තත්පරයක ඇසිල්ලකින් රජ දහන ලැබිය හැකියි. ආරම්භයේ දී ඇතැම් දූවරුන් දැහැන්ගත වී දෙව්ලොව සිටියා. ශිව බාබා පැමිණ ඔබ දරුවන්ට දෙව්ලොව දර්ශන දීමට පුරුදුව සිටියා. දෙවි දේවතාවුන් පැමිණියේ එතරම්ම ආඩම්බරයෙන් සහ ගෞරවයෙනි. එමනිසා, පරමාත්ම පියා අප්‍රකටව පැමිණ අපට විස්තර කර දීම ගැන ඔබ දරුවන්ගේ හදවත් සලිත වෙයි. ඔහු පැමිණෙන්නේ බ්‍රහ්මාගේ ශරීරයටයි. බ්‍රහ්මාගේ ශරීරයද මෙහි තිබේ. ප්‍රජාපිතා බ්‍රහ්මා මඟින් ස්ථාපනය සිදු වෙයි. මෙහි එන කෙනෙකුගෙන් ඔබ මෙසේ ඇසිය යුතු යැයි බාබා විස්තර කර දී ඇත. ඔබ පැමිණියේ කා වෙතද? බ්‍රහ්ම කුමාරින් වෙතයි. හොඳයි ඔබ බ්‍රහ්මාගේ නම මීට පෙර අසා තිබේද? ප්‍රජාපිතා බ්‍රහ්මා සිටිනවා නේද? ඔබ සැවොම ඔහුට දැන් අයිතියි. අප මීට පෙරත් නියතයෙන්ම ඔහුට අයිතිව සිටියා. බ්‍රහ්මා තුළින් ස්ථාපනය සිදුවේ. එමනිසා, බ්‍රහ්මින්වරුද අවශ්‍යයි. බ්‍රහ්මා තුළින් පරම පියා තේරුම් කරන්නේ කා හටද? ඔහු විස්තර ලබා දෙන්නේ කෂුද්‍රයින්ටය. මේ බ්‍රහ්මින්වරු කටින් උපන් නිමැවුම්ය. ශිව බාබා බ්‍රහ්මා තුළින් අප ඔහුට අයිති කර ගත්තේය. බොහෝ බ්‍රහ්ම කුමරුන් හා කුමරියන් ඇත. බොහෝ මධ්‍යස්ථානද ඇත. මේ සියල්ලෝම බ්‍රහ්ම කුමාරයින් වෙතින් ඉගෙනුම ලබයි. මෙහිදී, අපි සීයාගේ උරුමය ලබමු. පරමාත්ම දෙවියන් කතා කරයි මම ඔබට රාජයෝගා උගන්වමි. ඔහු අශරීරික නිසා, මොහුගේ ශරීරයේ සහය ලබා ගෙන කතා කර අපට ඥානය ලබා දෙයි. දරුවන් සියලු දෙනා ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන්ය. අප ප්‍රජාපිතා බ්‍රහ්ම කුමරුන් හා කුමාරින් වෙයි. ශිව බාබා දාදා (සීයා) වෙයි. ඔහු අපව ඇතිදැඩි කර හදා ගත්තේය. ඔබ දන්නවා බ්‍රහ්මා තුළින් දාදාගෙන් අප ඉගෙන ගන්නා බව. මේ ලක්ෂ්මී සහ නාරායන දෙදෙනාම දෙව්ලොව හිමිකරුවන්ය. ඉහළම ඉහළ අශරීරික කෙනා පමණයි දෙවියන්. ඔබ මෙය ඉතා හොඳින් උකහා ගත යුතුය. සියල්ලට පළමුවෙන් භක්ති මාර්ගයේ දී ඔබට පියවරුන් දෙදෙනෙක් සිටින බව විස්තර කරන්න. දෙව්ලොව දී ඔබට සිටින්නේ එක පියෙකි. පාරලෞකික පියාගෙන් ස්වාධිපත්‍ය ලැබූ විට ඔහුව සිහි කරන්නේ ඇයි? එහි දුකක් නොවන විට ඔහු සිහිකරන්නේ කුමකටද? මෙසේ ගැයේ දුකින් මුදවාගන්නාණනි! සතුට දානය කරන්නාණනි! එය අදාල මේ කාලයටයි. අතීතය බවට පත් වන දෙය පසුව සිහි කෙරේ. පැසසුම ඇත්තේ එකම එක කෙනාටයි. එම එකම පරමාත්ම පියා පැමිණ අපිරිසිදු අය පිරිසිදු

කරයි. මිනිසුන් මේවා තේරුම් ගන්නේ නැත. ඔවුන් වාඩි වී අතීතය පිළිබඳ කතාන්තර ලියයි. ඔබ දැන් තේරුම් ගෙන සිටිනවා පියා ඔබට රාජයෝගා උගන්වා ඒ තුළින් ස්වාධිපත්‍ය ලබා දුන් බව. ඔබ 84 චක්‍රය පුරාම සිටිමින් දැන් නැවත ඉගෙන ගනී. ඉන්පසු උපත් 21ක්ම පාලකයින් වෙයි. ඔබ ඔවුන් සේම දෙවි දේවතාවන් බවට පත් වෙයි. පසුගිය චක්‍රයේද ඒ ලෙසම පත් විය. ඔබ තේරුම් ගන්නවා දැන් ඔබ උපත් 84 වූ චක්‍රය පුරා සිටි බව. ඔබ නැවත දැන් ස්වර්ණමය හා රිදී යුගයන්ට යමින් සිටී. පියා මෙසේ අසන්නේ ඒ නිසයි ඔබ කී වතාවක් මීට පෙර අප හමු වී ඇත්ද? මෙය යම් ප්‍රායෝගිකව සිදුවන දෙයක් නේද? අළුත් අය මෙය අසන විට, ඔවුන් තේරුම් ගනීවි, නියතයෙන්ම උපත් 84ක චක්‍රයක් ඇති බව. චක්‍රය, සම්පූර්ණ චක්‍රයක් වන්නේ ආරම්භයේ දී ම එන අයට පමණයි. සියලු දේ බුද්ධියෙන් ගණනය කළ යුතුයි. බාබා, අප ඔබ මේ ගොඩනැගිල්ලේ දී මේ ඇඳුමෙන්ම මුණ ගැසුනා වගේ ම දිගටම මුණගැසෙනවා. ඔබ දිගටම අපිරිසිඳු බවින් පිරිසිඳු බවටත් පිරිසිඳු බවින් අපිරිසිඳු බවටත් පත් වුණා. කුමක් හෝ නිරන්තරයෙන් අළුත් පිටම තිබීම සිදු විය නොහැකියි. සැම දෙයක්ම නියතයෙන්ම ජරාජීර්ණ බවට පත් වේ. සැම දෙයක්ම සතෝ, රජෝ සහ තමෝ යන තත්ත්වයන් තුළින් ගමන් කළ යුතුයි. ඔබ දරුවන් දැන් තේරුම් ගන්නවා නව ලෝකය එමින් තිබෙන බව. එය හඳුන්වන්නේ දිව්‍යලෝකය යන පදයෙනි. මෙය අපායයි. එය පිරිසිඳු ලෝකයයි. බොහෝ මිනිසුන් මෙසේ අඬගසයි පාරිශුද්ධකරුවාණනි, පැමිණ අපව පිරසිඳු කරන්න! ඔවුන් කෑ අඬගසන්නේ දුක වැඩි වෙමින් තිබෙන නිසාය, නමුත් ඔවුන්, වන්දනාවට සුදුසු බවත් ඉන්පසු වන්දනාකරුවන් බවත් ඔවුන් නොදනී. අප වන්දනාකරුවන් වූයේ ද්වෝපූර් යුගයේ දීය. නොගිණිය හැකි තරම් ආගම් දිගටම එයි. අපිද දිගටම අපිරිසිඳු බවින් පිරිසිඳු බවටත් පිරිසිඳු බවින් අපිරිසිඳු බවටත් පත් වුණා. නාටකය පදනම් වන්නේ භාරතය මතයි. ඔබ දරුවන්ට දැන් සිහිපත් බව තිබෙන අතර දැන් ඔබ ශිවාගේ උපන් දිනය සමරයි. වෙන අය ශිවා ගැන දන්නේ ද නැත. අපි ඔහුව දනී. ඔහු සත්‍ය ලෙසම අපට රාජයෝගා උගන්වයි. බ්‍රහ්මා තුළින් දෙව්ලොව ස්ථාපනය සිදු වෙයි. නියතයෙන්ම, මෙම රාජයෝගා ඉගෙන ස්ථාපනය කරගෙන යන අය රජදහනේ වාසනාව ලබයි. අපි මෙසේ කියමු අපි ඇත්තෙන්ම මෙම රාජයෝගා පරමාත්ම පියාගෙන් හැම චක්‍රයේම උගනිමු. බාබා විස්තර කර තිබෙනවා, උපත් 84 චක්‍රය දැන් අවසානයට ළක්වෙමින් තිබෙන බව. ඉන්පසු අපි නව චක්‍රය පුරාම යන්නෙමු. ඔබ චක්‍රය තේරුම් ගත යුතුයි. මෙම පිංතූර නැතත් මේවා ඔබට විස්තර කර දිය හැකියි. මේවා ඉතා සරළය. භාරතය ඇත්තෙන්ම දෙව්ලොව වූ අතර දැන් එය අපායයි. කලියුගය එහි මුල් අදියරේ තිබුණු බව සමහර මිනිසුන් කියවනවා පමණි. ඔබ කියන්නේ මේ කලියුගයේ අවසානය කියාය. චක්‍රය දැන් අවසන් වීගෙන යයි. පරම පියා මෙසේ කියයි මා පැමිණියේ අපිරිසිඳු ලෝකය පිරිසිඳු කිරීමටයි. ඔබ දන්නවා අප පිරිසිඳු ලෝකයට යන බව. ඔබ තේරුම් ගෙන ද සිටිනවා විමුක්ති දේශය සහ ජීවන මුක්තියත්, සාම දේශය සහ සතුටු දේශයත්, දුක් ලෝකයත්. කොහොමනමුත්, ඔවුන්ට වාසනාව නැති නම්, මා සතුටු දේශයට නොයන්නේ ඇයි? යන සිතිවිල්ල නොපැමිණේ. එම සාම දේශය ජීවාත්ම සත්තාවන්ගේ මහගෙදරයි. ජීවාත්ම සත්තාවන්ට අවයව නොමැති නිසා කිසිවක් නොකියවේ. හැම කෙනෙකුටම එහිදී සාමය ලැබේ. සත් යුගයේ දී, එහි ඇත්තේ එක ආගමයි. මෙම ලෝක නාටක චක්‍රය සදාතනික හා අවිනාශී වෙයි, එය දිගටම කැරකේ, ජීවාත්ම සත්තාවන් කිසි විට විනාශ නොවේ. ඔබ සැවොම කෙටි කලකට සාම දේශයේ සිටිය යුතු වේ. මෙය තේරුම් ගත යුතු දෙයකි. කලියුගය යනු දුක් දේශයයි. එහි නොගිණිය හැකි තරම් ආගම් සියල්ලත් බොහෝ කලබලත් ඇත. සම්පූර්ණයෙන් දුකින් පිරි ලෝකයක් ඇති කළ, එවිටයි පරමාත්ම පියා පැමිණෙන්නේ. දුක් දේශයෙන් පසු කාලයේ දී දේශය සතුටින් පිරේ. අපි සාම දේශයෙන් පැමිණ සතුටු දේශයට ඇතුළු වෙමු. එවිට එය දුක් දේශය බවට පරිවර්ථනය වේ. සත් යුගයේ දී ඔවුන් පාපයෙන් සම්පූර්ණයෙන් තොර අතර මෙහිදී සම්පූර්ණයෙන් පාපයෙන් බරය. මෙය විස්තර කිරීම ඉතා පහසුය. ධෛර්ය අවශ්‍යය. ඔබට ඕනෑම තැනක ගොස් ඔවුන්ට විස්තර කළ හැකියි. හනුමන් ආධ්‍යාත්මික රැස්වීම් වලට ගොස් සපත්තු අතරේ වාඩි වී සිටි බව ලියැවී ඇත. නිර්භීත රණවිරුවන් ඕනෑම තැනකට ගොස් රාජතාන්ත්‍රිකව අන් අය කියන දේට සවන් දෙයි. ඔවුන්ට යහපත කිරීම සඳහා ඔබට ඇඳුම වෙනස් කර යා හැකියි. බාබාද ඔබට යහපත කරන්නේ අප්‍රකටවය. ඔබට සිද්ධස්ථානයකට යාමට ආරාධනා ආදිය ලැබුණු විට ඔබ එහි ගොස් ඔවුනට විස්තර කර දිය යුතුයි. දවසින් දවස ඔබ වඩා දක්ෂ බවට පත් වේ, ඔබ පරමාත්ම පියා හැම කෙනෙකුටම හඳුන්වාදීම කළ යුතුයි. මෙය උත්සාහ කර බලන්න. සන්‍යාසීන් හා රජවරු සැම අවසානයේ එන බව සිහිපත් කෙරේ. ජනක් රජු ජීවන්මුක්තිය ලැබුවේ තත්ත්පරයක ඇසිල්ලකිනි. ඉන්පසු ඔහු අනුජනක් (අනාගතයේදී ජනක් වන අය) බවට ත්‍රේත යුගයේ දී පත් වෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. විනාශයේ අවසාන දර්ශන දැකීම සඳහා, ඔබේ තත්ත්වය නිර්භය සහ අචල ලෙස මහාවීර් සේ බවට පත්කරගන්න. අප්‍රකට ආකාරයෙන් ස්මෘති වන්දනාවේ යෙදී සිටින්න.
2. සූක්ෂම කලාපයේ නිවැසියෙක් වන සුරදූත තත්ත්වයට පත් වීමට නම්, ඔබේ ඇට මිදුළු හැම එකක්ම, දාදීජී ඍෂි කළාක් මෙන් අසීමිත සේවයට කැප කරන්න.

**වරදානය:** ඔබ පහසු යෝගීවරයෙකු වී පළමු ශ්‍රීමත් කරුණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමෙන් ඔබේ අත්තිවාරම ශක්තිමත් කර ගනිත්වා.

බාප්දාදාගේ අංක එකේ ශ්‍රීමත් කරුණ නම්: තමා ජීවාත්මයක් ලෙස සලකා පියා සිහිපත් කරන්න. තමා ජීවාත්මයක් ලෙස සලකනවා වෙනුවට, ඔබ සාමාන්‍ය ශාරීරික ජීවියෙකු ලෙස සලකන්නේ නම්, ඔබට ස්මරණයක් තිබිය නොහැක. දේවල් දෙකක් එකට එකතු වීමට පෙර, ඒවා මුලින්ම සමාන වන ආකාරයටම, ඔබ ජීවාත්මයක් ලෙස සලකන අතරතුර ඔබට ස්මරණය ඇති විට, ඔබේ ස්මරණය පහසු වනු ඇත. මෙම ශ්‍රීමතය වූ කලී ප්‍රධාන අත්තිවාරමයි. මෙම කරුණ කෙරෙහි නැවත නැවතත් අවධානය යොමු කරන්න, එවිට ඔබ පහසු යෝගීවරයෙකු වනු ඇත.

**පාඨය:** ඔබේ කර්මය යනු ඔබේ ආත්මය දෙස බැලිය හැකි කැඩපතයි. එමනිසා, ඔබේ ක්‍රියා තුළින් ඔබේ ශක්ති ස්වරූපය හෙළිදරව් කරන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

සාමාන්‍යයෙන්, කිසිවෙකු බන්ධනයක සිටීමට කැමති නැත, නමුත් ඔබ යම් දෙයකින් බලපෑමට ලක් වූ විට, ඔබ බන්ධනයකින් බැඳී සිටී. එබැවින්, ඔබ යම් දෙයකින් බලපෑමට ලක් වූ ජීවාත්මයක් ද නැතහොත් නිදහස් ද යන්න පරීක්ෂා කරන්න. ජීවන විමුක්තියේ සතුට තිබෙන්නේ දැන්ය. අනාගතයේ දී, ජීවන මුක්තියේ සහ බන්ධන ජීවිතයක වෙනස නොතිබෙනු ඇත. මේ අවස්ථාවේ ජීවන මුක්තියේ අත්දැකීම උසස් ය. ඔබ ජීවිතයේ සිටී, නමුත් නිදහස් ය, බන්ධනයේ නොවේ.